සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 50 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... නාට්‍ය හා රංග කලාව I කාලය පැය 01 යි.

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**අංක 01 සිට 40 තෙක් දී ඇති පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

* **පහත දැක්වෙන ගද්‍ය, පද්‍ය සංවාද ඛණ්ඩ ආශ්‍රයෙන් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A- ගුරුන්නාන්සේ :- නානු ගා ගත්තා නම් නාන්න එපැයි. ඔහොම ඉන්න පුළුවනැයි.

B- වසන්ත ශ්‍රීයෙන් අලංකාර වූ, මඟුල් මඩුවකට බඳු වූ වනාන්තරයේ ශෝභාව නරඹමින් යනවිට ...........

C- මඩගුලි ගෙනත් පෙරළා ඉඳගෙන වක්ක
බඩහැල මලේ අරගෙන පලයන් බොක්ක

D- ඇඳුරා :- බස් යන්නේ මේ පාරෙන් නෙවේ. එහා පාරෙන්

E- ගම්බිර කාලිංග නුවර - නිරිඳුගෙ වාසල පුරයට
ඉන්න දනාසේම රජුට - සෝදා පට පිළි සොඳට

01. සූනියම් ශාන්ති කර්මය සඳහා අදාළ වන්නේ,
    01. D  02. C  03. B  04. A

02. රට යකුම ශාන්ති කර්මය සඳහා අදාළ වන්නේ
    01. B  02. A  03. D  04. E

03. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් සඳහා අදාළ වන්නේ,
    01. C  02. D  03. B  04. A

04. කෝලම් නාට්‍ය සඳහා අදාළ වන්නේ,
    01. B  02. C  03. D  04. E

05. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථාවක් සඳහා අදාළ වන්නේ,
    01. C  02. D  03. B  04. A

**නිවැරදි පිළිතුර තෝරන්න.**

06. නෘත්‍ය සණයට අයත්වන අංගයන් වන්නේ,
    01. මනිපුරි, කථක්, භරත නාට්‍යයම්  02. ලී කෙළි, වෙස් නැටුම්, තෙල්මෙ පද
    03. මනිපුරි, ලී කෙලි, යක්ෂගාන  04. ඔපෙරා, මුද්‍රා නාට්‍ය, කථක්

07. ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක් මත ඉදිරිපත් කෙරෙන නිරූපණ කලාව වන්නේ,
    01. ක්ෂණික නිරූපණ  02. අභිරූපණ  03. ප්‍රාසාංගික කලාව  04. සාමූහික නිරූපණ

08. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය 02 ක් ලෙසින් හඳුනාගත හැක්කේ,
    01. මනමේ හා සිංහබාහු  02. රත්තරන් හා මහාසාර
    03. කැළණි පාලම හා තලමල පිපිලා  04. කැළණිපාලම හා රත්තරන්

09. පන්දම් එළි, කොප්පරා පහන්, දුම්මල කීරි ගැසීම ආදී ආලෝක ක්‍රම යොදා ගන්නා ලද්දේ,
01. ඔපෙරා නාට්‍ය සඳහා ය. 02. ගීත නාට්‍ය සඳහා ය.
03. මුද්‍රා නාට්‍ය සඳහා ය. 04. ශාන්ති කර්ම හා ගැමි නාටක සඳහා ය.

10. තාලානුකූල චලන ලෙස හඳුන්වනු ලබන්නේ,
01. සාමාන්‍ය ගමන් රටාව ය. 02. පරිකල්පනය ආශ්‍රිත චලනයන් ය.
03. කිසියම් තාලයකට අනුව චලනවල යෙදීම ය. 04. වේගයෙන් ඇවිදීම ය.

11. ආලෝකය අඩු සහ වැඩි කරන පාලක උපකරනය වන්නේ,
01. මිරබෝල් 02. ඩිමරය 03. වර්ණ චක්‍රය 04. සෙවනැලි නිර්මිත පහන

12. නූතන ප්‍රොසීනියම් වේදිකාව බෙදා ඇති කොටස් ගණන වන්නේ,
01. 9 කි. 02. 12 කි. 03. 15 කි. 04. 10 කි.

13. කායික සැහැල්ලු බව ඇති කිරීම සඳහා යෝග්‍ය වන රංග අභ්‍යාසය වන්නේ,
01. ශිථිලකරණ අභ්‍යාස 02. තාපන අභ්‍යාස 03. ශ්වසන අභ්‍යාස 04. දර්පණ අභ්‍යාස

14. කාලගෝල නාට්‍ය සඳහා අදාළ කථා පුවත තෝරාගෙන ඇත්තේ,
01. ධර්මප්‍රදීපිකාවෙනි. 02. උම්මග්ග ජාතකයෙනි.
03. සද්ධර්මරත්නාකරයෙනි. 04. චූලවංශයෙනි.

15. නාට්‍යයක පසුතලය නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුත්තේ
01. අධික ලෙස වියදම් නොකිරීම. 02. ප්‍රේක්ෂකයාගේ ආකර්ශනය දිනා ගැනීම.
03. නළු කාර්ය පහසු කිරීම. 04. වේදිකාව සුන්දර කිරීම.

16. බුද්ධ ගද්‍යය, සකස්කඩ, යනාදිය පරිහරණය කිරීම තුළින් නළුවාගේ හෝ නිළියගේ ප්‍රගුණතාවය ඇති වන්නේ,
01. ස්වසන අභ්‍යාසයන් ය. 02. තාපන අභ්‍යාසයන් ය.
03. ශිථිලකරණ අභ්‍යාසයන් ය. 04. හඬ අභ්‍යාසයන් ය.

17. ප්‍රධාන ආලෝක පහන් වර්ග 02 වන්නේ,
01. යොමු පහන්/ ධාරා පහන්ය 02. ධාරා පහන්/ ඩිමරය
03. වර්ණ චක්‍රය / ඩිමරය 04. යොමු පහන් / මීරබෝල්

18. දේශීය නාට්‍ය කලාවේ පෝෂණය සඳහා ඉවහල් වුයේ,
01. නෝ නාට්‍ය කලාවයි. 02. භරත මුණි නාට්‍ය ශාස්ත්‍රයයි.
03. ඇදහිලි හා පූජා ක්‍රමයන්ය. 04. ඇරිස්ටෝටල් නාට්‍ය කලාවය.

19. ක්ෂණික නිරූපණයක් යනුවෙන් අදහස් කරන්නේ,
01. නාට්‍යධර්මී ශෛලියේ රංගනයකි.
02. දින ගණනාවක් පුහුණු වී ඉදිරිපත් කරන්නකි.
03. අත්දැකීමෙන් චරිත හා සිදුවීම් ක්ෂණිකව පෙළගැස්වීමය.
04. ගුරුවරයා විසින් පුහුණු කිරීමෙන් පසුව ඉදිරිපත් කිරීමය.

20. ප්‍රධාන අංග රචනා ක්‍රමයක් ලෙස හඳුනාගත නොහැක්කේ,
01. චරිතාංග අංග රචනය. 02. සරල අංගරචනය.
03. ඍජු අංගරචනය. 04. පුද්ගල ස්වරූප අංග රචනය.

**පහත වගුව ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| දොරකඩ හස්න<br>යුගාසන බණ | ගබඩා කොල්ලය<br>ගුරුගේ මාලාව | සූනියම් යාගය<br>රිද්දි යාගය | අඹ විදමන<br>රාම මැරීම |

21. උඩරට ශාන්ති කර්මයේ නාට්‍යමය අවස්ථා දැක්වෙන්නේ,
01. B හි ය. 02. A හි ය. 03. C හි ය. 04. D හි ය.

22. පහතරට ශාන්ති කර්ම දැක්වෙන්නේ,
01. B හි ය. 02. C හි ය. 03. A හි ය. 04. D හි ය.

23. මඩු ශාන්ති කර්මයක නාට්‍යමය අවස්ථා දැක්වෙන්නේ,
01. C හි ය. 02. A හි ය. 03. D හි ය. 04. B හි ය.

24. පූජාකර්ම ඇතුළත් වී ඇත්තේ,
01. D හි ය. 02. C හි ය. 03. B හි ය. 04. A හි ය.

25. වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය හඳුන්වනනේ,
01. නළු නිළියන් නමිනි. 02. රංග වින්‍යාසය නමිනි.
03. අංග රචනය නමිනි 04. ප්‍රේක්ෂාව නමිනි.

26. නාට්‍යයක අත්‍යවශ්‍යම අංගයක් වන්නේ,
01. ආනුෂංගික අංග, නළුවා සහ අධ්‍යක්ෂවරයා 02. අධ්‍යක්ෂවරයා, පෙළ සහ නළුවෝ
02. නළුවා, ප්‍රේක්ෂකයා සහ නාට්‍ය පිටපත 04. සංගීතය, නාට්‍ය පෙළ සහ නළුවෝ

27. නළුවරණය යනුවෙන් අදහස් කරන්නේ,
01. වේදිකාව තුළ නළු නිළියන් ස්ථානගත කිරීමය. 02. චරිත සඳහා ගැළපෙන නළු නිළියන් තේරීමය.
03. නළු නිළි පුහුණුවීම් ආරම්භ කිරීමය. 04. නළු නිළියන් අංග රචනය කිරීමය.

28. නාට්‍යයක් වේදිකාගත කිරීමේ දී පසුතල මාරුකිරීම් මෙහෙයවනු ලබන්නේ,
01. වේදිකා පරිපාලක විසිනි. 02. නාට්‍ය අධ්‍යක්ෂවරයා විසිනි.
03. රංග වින්‍යාස ශිල්පියා විසිනි. 04. අංග රචනා ශිල්පියා විසිනි.

**පහත රූප සටහන් ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


"ක" රූපය


"ග" රූපය

29. ඉහත "ක" හා "ග" හා මුහුණු දෙක
01. "ක" යනු සන්නි මුහුණකි "ග" යනු කෝලම් මුහුණකි. 02. "ක" හා "ග" යනු කෝලම් මුහුණයි.
03. "ක" හා "ග" යනු සොකරි වෙස් මුහුණුය. 04. "ක" හ "ග" යනු සන්නි මුහුණුය.

30. ඉහත "ක" හා "ග" යන මුහුණු දෙක
01. "ක" යනු පිස්සු සන්නියයි "ග" යනු දේවසන්නියයි.
02. "ක" යනු දෙමළ සන්නියයි "ග" යනු කණ සන්නියයි.
03. "ක" යනු දේවසන්නියයි "ග" යනු නාග සන්නියයි.
04. "ක" යනු කාපිරි කෝලමයි "ග" යනු නාග සන්නියයි.

**රූප සටහන ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නල වලට පිළිතුරු සපයන්න.**




31. ඉහත රූප සටහනේ 'A' මගින් දැක්වෙන්නේ,
01. ප්‍රොසීනියම් වේදිකාවේ මැද දකුණය. 02. ප්‍රොසීනියම් වේදිකාවේ ඉහළ දකුණය.
03. ප්‍රොසීනියම් වේදිකාවේ පහළ දකුණය. 04. ප්‍රොසීනියම් වේදිකාවේ මැද මැදය.

32. ඉහත රූප සටහනේ 'B' මගින් දැක්වෙන්නේ,
01. පින්තූර රාමු වේදිකාවේ "යට වම" ය. 02. පින්තූර රාමු වේදිකාවේ "යට දකුණය."
03. පින්තූර රාමු වේදිකාවේ උඩ දකුණය. 04. පින්තූර රාමු වේදිකාවේ උඩ වමය.

33. සවේශ පුහුණුව ලෙස හඳුන්වන්නේ,
01. සියලුම ආනුෂංගික අංග සමඟ කෙරෙන අවසන් පුහුණුව.
02. නාට්‍යයේ මංගල දර්ශනය.
03. රංගාලෝකය නාට්‍ය සඳහා යොදා ගැනීම.
04. නළු නිළියන් තෝරාගැනීම.

**පහත රූප සටහන් ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**


A


B


C


D


E


F


G


H

34. මෑතකාලීන දේශීය නාට්‍ය කලාව තුළ ප්‍රහසනාත්මක රංගනයන් සඳහා විශේෂිත නාට්‍යකරුවා දැක්වෙන්නේ,
01. D    02. B    03. E    04. F

35. "බෙරහඬ" නාට්‍යයේ නාට්‍ය අධ්‍යක්ෂවරයා වන්නේ,
01. D    02. B    03. G    04. H

36. ජංගම වේදිකාවක් හඳුන්වාදුන් නාට්‍යකරුවා වන්නේ,
01. E    02. G    03. H    04. B

37. "විකෘති" නාට්‍යයේ ප්‍රියංගනී ගේ මවගේ භූමිකාව ඉදිරිපත් කරන ලද්දේ,
01. F    02. C    03. B    04. A

38. "සුභ සහ යස" නාට්‍යයේ සුවිශේෂී රංගනයෙන් මෙන්ම වර්තමාන "කළු සුදු" නාට්‍යයේ අධ්‍යක්ෂණයෙන්ද ප්‍රේක්ෂකයාගේ ප්‍රසාදයට පත් වූ නාට්‍යකරුවා වන්නේ,
01. G    02. E    03. H    04. B

39. "හුණුවටය" නාට්‍යයේ සුවිශේෂී රංගනයක් ඉදිරිපත් කරන ලද රංගන ශිල්පීන් / ශිල්පිනියන් වන්නේ,
01. B හා F    02. A හා E    03. C හා G    04. A හා H

40. "තාරාවෝ ඉගිලෙති" නාට්‍ය සඳහා රංගනයෙන් දායක වන්නේ,
01. G    02. A    03. C    04. F

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**50 S II**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

**විභාග අංකය .................................... නාට්‍ය හා රංග කලාව II කාලය පැය 02 යි.**

**වැදගත් :**
**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. .**

01. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. මෙම නාට්‍යයේ වර්තමාන අධ්‍යක්ෂවරයාගේ නම කුමක්ද? (ල. 02)
ii. මෙම නාට්‍යයේ නාට්‍ය ශෛලිය කුමක්ද? (ල. 02)
iii. මෙම නාට්‍යය සඳහා ආභාසය කරගන්නා ලද නාට්‍ය වර්ගය කුමක්ද? (ල. 02)
iv. කාලගෝල දික්තලාව ප්‍රතික්ෂේප කරන්නේ කුමක් නිසාද? (ල. 02)
v. මෙම නාට්‍යයේ තේමාව කුමක්ද? (ල. 02)
vi. මෙම නාට්‍යයේ රඟපාන රංගන ශිල්පීන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල. 02)

02. i. රටයකුම හෝ සන්නියකුම ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශ තුනක් නම් කරන්න. (ල. 03)
ii. එම ශාන්තිකර්ම වල නාට්‍යමය අවස්ථා දෙක බැගින් ලියන්න. (ල. 04)
iii. එම නාට්‍යමය අවස්ථාවලින් එකක් විස්තර කරන්න. (ල. 05)

03. i. අභිනය යන්න හඳුන්වන්න. (ල. 02)
ii. අභිනයන් වර්ග කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)
iii. නළු කාර්ය සාර්ථක කරගැනීම සඳහා සතර අභිනය යොදා ගන්නා ආකාරය විස්තර කරන්න. (ල. 06)

04. i. අංගරචනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 03)
ii. අංගරචනය සඳහා භාවිතා වන අමුද්‍රව්‍ය 06 ක් නම් කරන්න. (ල. 04)
iii. වේදිකා නාට්‍යයක අංගරචනය සිදුකරන්නේ ඔබ නම් එය සිදුකරන ආකාරය විස්තර කරන්න. (ල. 05)

05. i. ප්‍රාසාංගික කලා අංග 4 ක් නම් කරන්න. (ල. 02)
ii. ඉන් එක් කලා අංගයක් විස්තර කරන්න. (ල. 04)
ii. ප්‍රාසාංගික කලාවන් අතරින් නාට්‍ය කලාව සුවිශේෂී වන්නේ කෙසේද? විස්තර කරන්න. (ල. 06)

06. i. රංග අභ්‍යාස යන්න හඳුන්වන්න. (ල. 02)
ii. රංග අභ්‍යාස 04 නම් කරන්න. (ල. 04)
iii. රංග අභ්‍යාස 02 ක් විස්තර කරන්න. (ල. 06)

07. චතුමි පාසල් අධ්‍යාපන කටයුතු වලට මෙන්ම ක්‍රීඩාවටත්, බාහිර ක්‍රියාකාරකම් සඳහාත් ඉතා උනන්දුවෙන් යුතුව කටයුතු කරන ශිෂ්‍යාවකි. මෙවර නිවාසාන්තර ක්‍රිඩා උත්සවයේ 15 න් පහළ චැම්පියන් ලෙස තේරුණ ඇය, උත්සවය දිනය ළංවන තෙක් පුලපුලා බලා සිටියේ නොඉවසිල්ලෙනි. උත්සව දිනයේ පාන්දරම අවදි වූ ඇය, වත්ත පහළ දොලට ගියේ මුහුණ සේදීම සඳහාය. අම්මා ඇයව සොයා දොල ළඟට ගිය නමුත් මවට දැකගත හැකි වූයේ චතුමිගේ රබර් සෙරෙප්පු යුගලය පමණි.

ඉහත සිදුවීම ඔබ කැමති අවසානයක් කරා ගෙනයමින්, නාට්‍යමය සිදුවීම් අන්තර්ගත නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)
සංවාද, චරිත, රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 08)

**පළමු වාර පරීක්ෂණය - 2018**
**නාට්‍ය හා රංගකලාව - 11 ශ්‍රේණිය**
**විසඳුම් පත්‍රය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 1 | 31. | 2 |
| 02. | 2 | 12. | 1 | 22. | 2 | 32. | 1 |
| 03. | 3 | 13. | 1 | 23. | 3 | 33. | 1 |
| 04. | 4 | 14. | 2 | 24. | 4 | 34. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 4 | 35. | 2 |
| 06. | 2 | 16. | 4 | 26. | 3 | 36. | 3 |
| 07. | 3 | 17. | 1 | 27. | 2 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 1 | 38. | 2 |
| 09. | 4 | 19. | 3 | 29. | 4 | 39. | 3 |
| 10 | 3 | 20. | 4 | 30. | 3 | 40. | 4 |

(1x 40 = 40)

## II කොටස

01. i. පුන්‍යසේන ගුණසිංහ ii. නාට්‍ය ධර්මී iii.නාඩගම්
iv. තමාට දික්තලාව නොගැළපෙන බව වටහාගත් නිසා v. නොගැළපෙන විවාහයක් නොකළ යුතු බව
vi. රිචඩ් මානමුදලි , මැණිකේ අත්තනායක

02. I. ගාල්ල, මාතර, හම්බන්තොට
ii. රටයකුම - නානුමුරය, දරු නැලවිල්ල
සන්නියකුම - සූනියම් යක්ෂණියගේ අවස්ථා
iii. එක් නාට්‍යමය අවස්ථාවක් උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. i. අභිනය යනු ඉදිරියට පැමිණවීමයි.
යන අදහස මතුකරයි නම් ලකුණු ලබාදෙන්න.
ii. සතර අභිනය කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. නළුකාර්ය සඳහා ආංගික වාචික සාත්වික ආහාර්ය අභින යොදාගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

04. i. නළු නිළියන්ගේ ආවරණය නොවූ කොටස් (මුහුණ සහ අනෙකුත් අංග) චරිතයට අවශ්‍ය ලෙස නිර්මාණශීලීව වර්ණ ගන්වා සකස් කිරීම.

ii. ෆවුන්ඩේෂන්
ලයිනින් කලර්ස්
අයිබ්‍රෝ පෙන්සිල්
ලිප්ස්ටික්
නෝස් පොට්
ක්‍රේප් හෙයා
} - ආදි ලෙස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. නළුවකු සඳහා අංගරචනය සිදුකරන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05. i. බැලේ නාට්‍ය, ඔපෙරා නාට්‍ය, ගීත නාට්‍ය, නර්තනය, සංගීතය ආදී
ii. නම් කර ඇති ප්‍රාසාංගික කලා අංග අතරින් එකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. සතර අභිනය භාවිතා කිරීම, පිටපත භාවිතය, සෘජු ප්‍රේක්ෂක පිරිසක් සහභාගිවීම, ශ්‍රව්‍ය දෘෂ්‍ය සජීවී බව, ගබඩා කළ නොහැකි වීම ආදී ලෙස කරුණු විස්තරාත්මකව සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06. i. රංග අභ්‍යාස යන්න කෙටියෙන් හඳුන්වා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
ii. රංග අභ්‍යාස 04 ක්
දර්පණ අභ්‍යාස, ස්වසන අභ්‍යාස, ශිථිලකරණ අභ්‍යාස, කටහඬ අභ්‍යාස
iii. රංග අභ්‍යාස 02 විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

07. i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)
ii. සංවාද, චරිත, රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 08)